# සබරගමුවේ අභිචාර විධි

## චම්පා ද සිල්වා

අනාදිමත් කාලයක් මුළුල්ලේ එක් රැස් වෙමින් මුඛ පරම්පරා ගතව පැවත ආ මිනිස් දැනුම් සම්භාරයක් ඇත. ජනශ්‍රැතිය ලෙස හඳුන්වනු ලබන්නේ මෙසේ අවිච්ඡින්නව පැවත ආ මිනිස් දැනුම් සම්භාරයයි.

වත්මනෙහි ජනශ්‍රැතිය යන වචනය ව්‍යවහාර කෙරෙන්නේ ඉංග්‍රීසි භාෂාවෙහි යෙදෙන, ෆෝල්ක් ලෝ, යන්නට සමාන වූ පාරිභාෂික පදයක් වශයෙනි. ජනශ්‍රැතිය යන වදන පළමු වරට භාවිත කරන ලද්දේ ඉංග්‍රීසි ජාතික ලේඛකයෙකු වූ විලියම් ජේම්ස් තොම්ස් විසින් 1846 වසරේදී ය. ජන කලාවල ලේඛනාරූඪ නොවී කටින් කට පැවත එන කතා, රූඪ, සිරිත් විරිත්, ජන විශ්වාස, යන්තර මන්තර, පුද පූජා ආදී ද ජනශ්‍රැතිය යන්නෙන් විස්තර කෙරිණි (රත්නපාල 1991 : 10).

ජනශ්‍රැතිය අධ්‍යයනය කරන විට ඉතා වැදගත් කරුණක් වන්නේ විවිධ ජන කොට්ඨාශවල එම ජනශ්‍රැති විවිධාකාරයෙන් ක්‍රියාත්මක වීමය. ශ්‍රී ලංකාවේ ද වැදි ජන කොට්ඨාස අතර පවත්නා භාෂාව, ගායන විලාස, නැළවිලි ගී, ඇදහිලි හා විශ්වාස ආදිය ඔවුන්ගේ ජනශ්‍රැති වශයෙන් හඳුනාගත හැකිය. (රත්නපාල 1991 : 13).

මිනිසාගේ විශ්වාස හා ඇදහීම්වල ම කොටසක් වන අභිචාර ක්‍රම ද ජනශ්‍රැතියට අයත් වන තවත් ක්ෂේත්‍රයක් ලෙස හඳුන්වා දිය හැකිය. ඒ අනුව ශ්‍රී ලාංකිකයින්ට ආවේනික වූ ජනශ්‍රැතියක් පවතින බව ප්‍රත්‍යක්ෂ ය.

සාම්ප්‍රදායික සමාජයේ සංවිධානය වූ සහ ආයතනගත වූ පොදු විශ්වාසයන් වශයෙන් අභිචාර හඳුනාගත හැකි ය (සිල්ස් 1968 : 526) සමාජ විද්‍යාඥයින් අභිචාර විධි ප්‍රධාන වශයෙන් ම සුදු අභිචාර සහ කළු අභිචාර වශයෙන් කොටස් 2 කට බෙදා ඇත.

අධි ස්වාභාවික පුද්ගලයන්ගේ හැකියාව මගින් අනෙකුත් පුද්ගලයන්ට සුභ සාධනය සඳහා සුදු අභිචාර යොදා ගන්නා අතර, අයහපතක් කිරීම සඳහා කළු අභිචාර යොදා ගනු ලබයි. (ටයිලර් 1990 :331– 332). ඒ අනුව ගම්මඩු උත්සවය, බෝධි පූජා යනාදිය සුදු අභිචාරයන් සේ සැලකෙන අතර හූනියම් කිරීම, වස් කවි කිම, පළි ගැසීම යනාදිය කළු අභිචාරයන් සේ සැලකේ.

ජේම්ස් ජෝර්ජ් ෆ්‍රේසර් පෙන්වා දෙන පරිදි අභිචාර විධි යනු ස්වභාවධර්ම නීතියේ ව්‍යාජ ක්‍රමයක් සේ ම පැවැත්මේ ව්‍යාජ අතාර්කික මඟ පෙන්වීමකි (ෆ්‍රේසර් 1950: 11).

ෆ්‍රේසර්ට අනුව අභිචාර විධි සිදු කරන ලබන ක්‍රමය අනුව සමානාත්මතා න්‍යාය සහ ස්පර්ශාත්මක න්‍යාය වශයෙනුි කොටස් දෙකකට බෙදිය හැකි ය.

සමානාත්මතා න්‍යාය අනුව සිදු කරන ලබන අභිචාර ක්‍රමයන්හිදී එය සිදු කරන පුද්ගලයා සිතන පරිදි සතුරා වෙත ඕනෑම ප්‍රතිඵලයක් ලබා දිය හැකි වන අතර එය අනුකරණය මගින් සිදු කෙරේ. බෝනික්කෙකුට ඇණ ගැසීම, සතුරාට හියකින් විදීමට සැලැස්වීම නිදසුන් සේ දැක්විය හැකි ය.

සතුරාට අයත් නිය, කෙස් වැනි ශාරීරික කොටස් ගෙන කරනු ලබන අභිචාර මගින් එය අයත් පුද්ගලයාට අයහපත් ප්‍රතිඵල ලැබෙන බව එය සිදු

කරන පුද්ගලයා විශ්වාස කරයි . (ෆ්‍රේසර් 1950:11).

අභිචාර විධි පිළිබඳ ඉතා වැදගත් කරුණු ඉදිරිපත් කළ මානව විද්‍යාඥයකු ලෙස, මැලිනොව්ස්කි, හඳුන්වා දිය හැකිය. ඔහුට අනුව අභිචාර විධි දළ වශයෙන් පහත දැක්වෙන පරිදි ඵලදායක, ආරක්ෂාදායක සහ විනාශදායක වශයෙන් වර්ගීකරණය කළ හැකි ය (මැලිනොව්ස්කි 1922: 392 – 426).

රේමන්ඩ් ෆර්ත් **(Raymond Firth)** මහුගේ මානව ප්‍රභේද නම් කෘතියෙහි අභිචාර විධි මීට සමාන ලෙස ම නිෂ්පාදන අභිචාර විධි, ආරක්ෂක අභිචාර විධි සහ විනාශකාරී අභිචාර විධි වශයෙන් වර්ගීකරණය කර ඇත. (ෆර්ත් 1956 : 25).

රේමන්ඩ් ෆර්ත් හා මැලිනොව්ස්කිගේ මෙම වර්ගීකරණයන්ට අනුව ඵලදායක හා නිෂ්පාදන අභිචාර යන දෙවර්ගය සමාන වන බව පෙනේ.

පළමු කී අභිචාර විධි ආර්ථික හා පෙම් බැඳිම් සඵලත්වය සඳහා ද දෙවැන්න දේපල හා ශාරීරික ද්‍රව්‍ය ආරක්ෂා කිරීම සඳහා ද තුන්වැන්න සතුරන්ගේ විනාශය සඳහා ද යොදාගනු ලැබේ.

සබරගමු ප්‍රදේශයේ පවතින අභිචාර විධි සාකච්ඡා කිරීමේ දී මෙම වර්ගීකරණය සැලකිල්ලට භාජනය කිරීම වැදගත් වේ. ලාංකික බොහෝ ජන කොටස් අතර විවිධ අන්දමේ අභිචාර ක්‍රම පවතී. සබරගමුව ප්‍රදේශයේ ද විවිධ අන්දමේ අභිචාර ක්‍රම ක්‍රියාත්මක වේ.

## නිෂ්පාදන අභිචාර ක්‍රම

මෙම ප්‍රදේශයේ පවතින, කිරිමඩු ශාන්ති කර්මය, නිෂ්පාදන අභිචාර විධි ගණයට අයත් වන අතර සබරගමුවට පමණක් ම ආවේනික බව ද කිව යුතුය. ගොවිතැනෙහි හා ගව පාලනයෙහි දියුණුව අපේක්ෂාවෙන් පවත්වන මෙම ශාන්ති කර්මයේ දී ප්‍රධාන ස්ථානය හිමිවන්නේ මංගර දෙවියන්ට ය.

සබරගමු ප්‍රදේශයෙහි පවත්නා වූ ශාන්ති කර්ම අතර සත්ව වර්ගයා වෙනුවෙන් පවත්වනු ලබන එකම ශාන්ති කර්මය කිරිමඩුවයි (කෝට්ටගොඩ 1995:21). බළංගොඩ වියළි දේශගුණික තත්වයක් පවතින කල්තොට, තන්ජන්තැන්න, මැද බැද්ද යනා දී ප්‍රදේශවල මංගර දේව ඇදහිල්ල ප්‍රචලිත ය. ප්‍රධාන මංගර දේවාලය බළන්ගොඩ තංජම නැමැති ගමෙහි පිහිටා ඇත.

මෙම දෙවියන්ගේ අඳින ලද දේව රූප දෙකක් වැඩිහිටි කන්ද කතරගම දේවාලයේ හා බේරුවල දුතියම් දේවාලයේ තැන්පත් කර ඇත. එම රූපය අත් සතරකින් යුක්ත වන අතර බැටළු වාහනාරූඪ ව ඇත. වමතින් ගිනි කබලක් ද දකුණතින් පොල් මලක් ද අනෙක් දකුණු අත අභය මුද්‍රාවකින් ද ඉතිරි වමතෙහි කඩුවක් ද දිස්වෙයි. පිටිපස හුඹස් දෙකකි. රන්මාල, රන් මටුන්නක් පැළැඳ ඇත. කුඩා දළ දෙකක් මුව කෙලවර දෙපස දිස්වෙයි (දුසිල හිමි 1992:181).

කිරිමඩු ශාන්ති කර්මය සිදු කිරිමට ප්‍රථම ගොක් කොලයක් ගෙන පොල් ගසක කඳෙහි ගැට ගසනු ලැබේ. එයින් අදහස් කරන්නේ එම ගස මංගර දෙවියන් වෙනුවෙන් කැප කළ බව ය. ඉන් පසු එම ගසෙහි ඵලදාව පෞද්ගලික ප්‍රයෝජනය සඳහා නොගැනිම සිරිතකි. කිරිමඩුව ආරම්භ කරනු ලබන්නේ එලිවන යාමයේ ය. ඒ සඳහා අසල ඇති

තොටුපලක් හෝ ගං ඉවුරක් වැනි ස්ථානයක් තෝරා ගැනේ. මෙයින් අදහස් කරන්නේ මංගර දෙවියන්ගේ වාසස්ථාන කලවිටි, ගංඕවිටි ආදි ස්ථාන බව ය. මෙම ශාන්ති කර්මයේ දී කිරි ඉතිරවීමක් ද සිදු කෙරේ. මෙම ශාන්ති කර්මය සිදු කිරීම සඳහා කාන්තා පාර්ශවයේ කිසිදු සහභාගිත්වයක් සිදු නොවන අතර අවසානයේ දී සකස් කරනු ලබන, ගෝතඹ රොටි, හෙවත් කහ රොටි, සකස් කරනු ලබන්නේ ද ඇදුරන් විසින්ම ය. හාල්පිටි සහ කහ දියර මිශ්‍ර කොට ගනිමින් සකස් කරනු ලබන මෙම කහ රොටි වර්ගය කැපී පෙනෙන විශේෂිත ලක්ෂණයකි. එසේම මෙම ශාන්ති කර්මයට සහභාගි වන සියලුම පුද්ගලයන් එම විශේෂිත කහ රොටි අනුභව කිරීම ද තවත් කැපී පෙනෙන ලක්ෂණයකි.

සබරගමුව ප්‍රදේශයට පමණක් ම අවේනික වූ සත්ව වර්ගයා වෙනුවෙන් පවත්වනු ලබන එකම ශාන්ති කර්මය වනුයේ ද කිරි මඩුවය. ගොවිතැනෙහි හා ගව පාලනයෙහි දියුණුව අපේක්ෂාවෙන් මෙය පවත්වනු ලබයි. වත්මනෙහි පවා මෙම ප්‍රදේශයෙහි සිටින බොහෝ ගව පට්ටි හිමියන් තම ගව ගාල්වලට වැළඳෙන කුර ලෙඩ වැනි ගවයින්ට වැළඳෙන රෝගවලින් ආරක්ෂාව පතා මෙම ශාන්ති කර්මය පවත්වයි. මංගර දෙවියන් ගවයින්ට අධිපති ගොපළු දෙවියන් ලෙස සැලකෙන බැවින් ගව මහිෂා දී සම්පත් වැඩි දියුණුව බලාපොරොත්තුවෙන් මෙය සිදු කෙරේ.

මානව විද්‍යාඥයෙකු වන ටයිලර්ට අනුව (1990) අභිචාර හා සමඟ සම්බන්ධිත ක්‍රියාවලියක් ලෙස යාතු කර්ම හඳුනා ගත හැකි ය. පොදු හෝ පෞද්ගලික සංකේත තුළින් ක්‍රියාත්මක කරනු ලබන විධිමත් කෘත්‍යයන් සමූහයක් යාතුකර්ම ලෙස හඳුනා ගත හැකි ය. එසේම ආගම සමඟ ද යාතුකර්ම සම්බන්ධ වන බව ගිඩ්න්ස් දක්වයි (ගිඩ්න්ස් 1993:

458). යාතුකර්මයන්ට යාඥා කිරීම, මැතිරීම, ගායනා කිරීම, ඇතැම් අහාර වර්ග අනුභව කිරීම, පානය කිරීම, යම් යම් දේ කිරීමෙන් වැලකී සිටීම, ඇතැම් දිනයන් නිරහාරව සිටීම ආදිය අන්තර් ගත වේ (ගිඩ්න්ස් 1993 : 458).

නිෂ්පාදන අභිචාර ක්‍රම යටතේ සබරගමුවේ පවත්වනු ලබන කිරි මඩුව ඇතුළු මඩු ශාන්ති කර්මවලට විශේෂිත ස්ථානයක් හිමිවන බව කිව යුතුය. ගම් මඩු, පාන් මඩු, පූනා මඩු, මල් මඩු, ගිනි මඩු ආදි විවිධ නම්වලින් හඳුන්වනු ලබන පූජා කර්මයන්හි පොදු අභිප්‍රාය වන්නේ අස්වැන්න බව භෝග සශ්‍රීකත්වය පැතීම සහ වස් දොස් දුරු කොට සෙත් ශාන්ති පැතීමය.

ප්‍රාදේශීය දෙවි කෙනෙකු වශයෙන් සබරගමු ජනතාව අතර ඉමහත් ප්‍රසාදයට පත්ව ඇත්තේ සුමන සමන් දෙවියන්ය. ජීවිතයේ සෑම වැදගත් කටයුත්තක දී ම සමන් දෙවිඳුන්ගේ ආශිර්වාදය හා රැකවරණය බලාපොරොත්තු වීම සබරගමු ප්‍රදේශවාසී සෑම පුද්ගලයෙකුගේ ම සිරිතකි. මැණික් කර්මාන්තය හා සබරගමු ජනතාව අතර ඇත්තේ ඉතා සමීප සබඳතාවකි. බොහෝ පුද්ගල කොටස් මැණික් සම්පත් බලාපොරොත්තුවෙන් සමන් දෙවිඳුන්ට පුද පූජා පැවැත්වීම විශේෂිත ලක්ෂණයක් ලෙස දැක්විය හැකිය. මැණික් සම්පත් ලබා දීමේ විශේෂිත හැකියාවක් සමන් දෙවිඳුන්ට ඇති බව එම කර්මාන්තයෙහි නියුතු බොහෝ ජන කොටස් විශ්වාස කරති.

මෙම ප්‍රදේශයෙහි පත්තිනි දේවිය ඇදහීම ද ජනප්‍රියය. බොහෝවිට මඩු ශාන්ති කර්ම පවත්වනු ලබන්නේ ද පත්තිනි දේවිය උදෙසාය. පහන් මඩුව පූනා මඩුව හැල්ලම් මඩුව ආදිය පත්තිනි දෙවියන් උදෙසා සිදු කරනු ලබන යාතුකර්ම වේ. සශ්‍රීකත්වය

හා ශාන්තිය ලබා ගැනීම මෙහිදී ද මූලික අභිප්‍රාය වේ.

වශී ක්‍රම ද අයත් වන්නේ නිෂ්පාදන අභිචාර අංශයට ය. වශී යනුවෙන් අදහස් කරනු ලබන්නේ කිසියම් ගුප්තමය බලවේගයක් මඟින් යම් තැනැත්තකු හෝ තැනැත්තියක ආකර්ෂණය කර ගැනීමය. පෙම් බැඳුම් සඵලත්වය සඳහා උපයෝගී කරගනු ලබන අභිචාර ක්‍රමයක් ලෙස වශී ක්‍රම දැක්විය හැකි ය. මේවා විවිධ ජන සමාජයන්හි විවිධ අයුරින් ක්‍රියාත්මක වන බව සිතිය හැකිය. මෙම ප්‍රදේශය තුළ පැවති ඇති බවට විශ්වාස කරන තොරතුරු කිහිපයක් අධ්‍යයනය කිරීමේ දී හමු විය.

බොහෝ විට ස්ත්‍රීන් ගේ සිත් දිනා ගැනීම සඳහා පුරුෂයින් විසින් ද පුරුෂයින්ගේ සිත් දිනා ගැනීම සඳහා ස්ත්‍රීන් විසින් ද භාවිත කරනු ලබන ක්‍රම කිහිපයක් ඇත. එයින් එක් ක්‍රමයක් ලෙස දැක්විය හැක්කේ දෙහි මැතිරීමය. තමන්ට අවශ්‍ය ස්ත්‍රියගේ හෝ පුරුෂයාගේ නම සහ රූපය දෙහි ගෙඩියේ ඇඳ අදාළ මන්ත්‍රයෙන් ජප කොට අවශ්‍ය පුද්ගලයා පැමිණෙන විට නොපෙනන සේ සැඟවී සිට එයින් දමා ගැසීමෙන් තමා වෙත ආකර්ෂණය වන බව කියැවේ.

ඉද්ද මල් මතුරා ස්ත්‍රීන් වශී කර ගැනීමේ ක්‍රමයක් ද ඇතිබව අසන්නට ලැබුණි. තමන්ට අවශ්‍ය ස්ත්‍රියට මැතිරූ මල පෙන්වීමෙන් ස්ත්‍රියට යම් කිසි ආකර්ෂණයක් එම පුද්ගලයා කෙරෙහි ඇති වෙතැයි කියවේ.

රන් තැඹිලි තෙල් සිඳ එයට අදාළ මන්ත්‍රයෙන් එකසිය අටවරක් මතුරා අවශ්‍ය ස්ත්‍රියගේ ශරීරයෙහි තෙල් ස්වල්පයක් ආලේප කිරීමෙන් ද ඇය ආකර්ෂණය වන බව කියවේ.

හොඩුපර ගෙඩි (ගොඩපර ගෙඩිවලට වඩා තරමක් විශාල ගෙඩි වර්ගයකි) තුනක් ගෙන, සොහොන් පලක ලිපක් සාදා, පස් පැහිරි දර උපයෝගී කොට ගනිමින් සින්දවා ගත යුතු බව කියැවේ. පස් පැහිරි දර යනු පැහිරි වර්ගයට අයත් දොඩම්, නාරං, ජම නාරං වැනි ශාකයන්හි දර ය.

රන් තැඹිලි තෙල් සිඳ, ජිවම් කර නළලේ ආලේප කර ගෙන ගොස් තමන්ට අවශ්‍ය ස්ත්‍රිය හෝ පුරුෂයා සමඟ සිනාසීමෙන් එම පුද්ගලයා තමා වෙත ආකර්ෂණය වන බව කියවේ.

නඩුහබවලින් ජයග්‍රහණය පතා ද මෙම අභිචාර විධිය ක්‍රියාත්මක වන බවක් ද අසන්නට ලැබුණි. තව ද, "මහාදේව රාජ බන්ධනය" නම් මන්ත්‍රයෙන් රන් තැඹිලි තෙල් ගෙන එම තෙල් එකසිය අට වරක් ජිවම් කොට නළලේ තිලකයක් තබා ගෙන ගොස් තමන්ට වුවමනා අය සමඟ සිනාසීමෙන් එම අය වශී වන බව කියවේ.

## ආරක්‍ෂක අභිචාර විධි

## යන්ත්‍ර පැළඳීම

ලංකාවේ අනිකුත් බොහෝ ප්‍රදේශවල මෙන් ම සබරගමු ප්‍රදේශයේ ද ආරක්‍ෂාව පතා විවිධ අභිචාර ක්‍රම අතීතයේදී ක්‍රියාත්මක වූ බව ද වත්මනෙහි ක්‍රියාත්මක වන බව ද කිව යුතුය.

යන්ත්‍ර පැළඳීම ද මන්ත්‍ර ශාස්ත්‍රානුගත ආරක්‍ෂා විධියක් සේ සැලකෙන අතර මෙකල දරුවන්ට පංචායුධ පැළඳවන්නේත් ආරක්‍ෂා විධියක් වශයෙන් බව පෙනේ. යන්ත්‍රයක් සකස් කිරීමේ දී විශේෂයෙන් ම එය මැතිරීමේ දී රහසිගතභාවය සූක්ෂමත්වය හා

පිරිසිදුකම යන මෙම අංග නොපිරිහෙළිය යුතුය (විජේසේකර 1960:196).

හෙණරාජ තෛලය වෙඩි නො වැදීමේ ආරක්ෂා විධියක් වශයෙන් ඉතා අතීතයේ සිට ම භාවිත වී ඇති බවට සාක්ෂ්‍ය ඇත. බ්‍රිතාන්‍ය පාලනයට විරුද්ධව සටන් වැදුණ, සරදියෙල්, නැමැත්තා මෙම හෙණරාජ තෛලය බහාලූ යන්ත්‍රයක් හෙවත් සූරයක් පැලඳ සිටි බවත් එය පැලඳ සිටිතාක් ඔහුට කිසිදු අනතුරක් සිදු නොවූ බවත්, එය ගැලවී ගිය පසු ඔහුට වෙඩි වැදුණ බවත් ජනප්‍රවාදයේ එන පුවතකි.

බොහෝ ලාංකික ජනතාව නක්ෂත්‍රය කෙරෙහි විශ්වාස කරති. ලංකාවේ සෑම ප්‍රදේශයකට ම පාහේ පොදු වූ තත්වයක් මෙම ප්‍රදේශයේ ද පවතින බව කිව යුතු ය. යම් තැනැත්තෙකුගේ ජන්ම පත්‍රය පරීක්ෂා කොට ග්‍රහ අපල, ඒරාෂ්ඨක අපල තිබේ දැයි දැන ගත හැකි ය.

විවිධ ග්‍රහ අපල දුරු කිරීම සඳහා එකිනෙකට විශේෂිත විවිධ යන්ත්‍ර ඇත. කුඩා දරුවන් නිතරම හැඬීම සිහිනෙන් බිය වීම යනාදිය සඳහා තඹ පත්තිරුවල ලියන ලද යන්ත්‍ර එම දරුවා නිදන කොට්ටය තුළට දමා මැසීම මෙම ප්‍රදේශයේ පවතින සිරිතකි. බාලගිරි දෝෂය කුඩා දරුවන්ට බොහෝවිට වැළඳෙන රෝගයකි. "බාලගිරි දෝෂය අද නොවේ හෙටයි" යනුවෙන් ලියන ලද දැන්වීමක් දරුවා නිදන කාමරය තුළ තැබීම බොහෝ නිවෙස්වල දක්නට ලැබේ. ලංකාවේ අනෙකුත් ප්‍රදේශවල ද මෙම ක්‍රමයම අනුගමනය කෙරේ. කුඩා දරුවන්ගේ රෝග සමනය සඳහා ශිවතිල, ධම්මර, නම් යන්ත්‍රය ද පළඳවනු ලැබේ.

රාහුගේ අපල සඳහා නාගර්ජන යන්ත්‍රයත්, නව ගුණ යන්ත්‍රයත්, බ්‍රහස්පති ග්‍රහයාගෙන් ඇතිවන අපල සඳහා විෂ්ණු ආසෝර යන්ත්‍රයත්, බුධ කේතු යන

ග්‍රහයන්ගේ අපල සඳහා නවනාථ යන්ත්‍රයත්, ඉරු මහ දශාවේ අපල සඳහා නිල මණ්ඩය යන්ත්‍රයත්, සෙනසුරු අපල සඳහා රතන යන්ත්‍රයත්, (සිකුරුගේ මහා දශාවේ අපල සහ සඳුගේ මහ දශාවේ අපල සඳහා ද මෙම යන්ත්‍රයම භාවිත කෙරේ.) අඟහරු මහා දශාවේ අපල සඳහා කන්ද කුමාර යන්ත්‍රයත්, ශනි ඒරාෂ්ටක අපල සඳහා, විෂ්ණු මණ්ඩල යන්ත්‍රයත් සුදුසු බව දෛවඥයන්ගේ අදහස ය.

## ඇස්වහ, කටවහ, හෝ වහ

ඇස්වහ පිළිබඳ විශ්වාසයක් බොහෝ ජන කොටස් තුළ ඇති බව පෙනේ. මින් අදහස් කෙරෙනුයේ කෙනෙකුගේ බැල්ම කාරණා කොට ගෙන එම බැල්මට ලක් වූ තැනැත්තා ලෙඩ දුක් ආදී අනර්ථකාරී දුර්භාග්‍යයන්ට භාජනය වන බවය. බොහෝ ලාංකීය ජන කොටස් මෙන්ම සබරගමු ජනතාව ද ඇස් වහ, කට වහ, හෝ වහ සම්බන්ධයෙන් විශ්වාස කරති. මෙවැනි දෑ කරනු ලබන්නේ දුෂ්ට චේතනා පෙරදැරි කොට ගෙන බව පැහැදිළිය. ඇස්වහ සම්බන්ධ වූ තවත් විශ්වාසයන් දෙකක් නම් කටවහ හා හෝවහ යි (ආරියපාල 1969: 251). අයහපත් චේතනාවෙන් කියනු ලබන වචන කටවහ ලෙසත්, හිල්ලුම හෝ වහ ලෙසත් හැඳින්විය හැකිය. බොහෝ විට අන්‍යයන්ගේ දියුණුව නොඉවසන සුලු පුද්ගලයන් විසින් කියනු ලබන කියුම් ඇදුණු විට කාරා කෙල පිඩක් ගැසීම අදත් මෙම ප්‍රදේශයේ බොහෝ වැඩිහිටියන් විසින් කරනු ලබන සිරිතකි. ඉතා රුවැති ළමයෙකු දෙස බලා එම ළමයාගේ රූපයට ඇස්වහ ගැතිමෙන් එම ළමයා වැහැරී අවලක්ෂණ වනු ඇතැයි ඇතැම් ජන කොටස් විශ්වාස කරති.

ඇස්වහ, කටවහ දෝෂ සමනය කිරීම සඳහා පවත්වනු ලබන අභිචාර ක්‍රමයක් නම් ඇස්වහ වතුර මැතිරීම ය. මේ සඳහා හිමිදිරි උදයේ, කපුටා

හැඩීමට පෙර කිසිවෙකු හා කථා නොකොට නැවුම් මුට්ටියකට ළිදකින් ජලය ගැනේ. මෙම කටයුත්තේ යෙදෙන ඇදුරා එම ජල බඳුනට අබ ස්වල්පයක් සහ කපූ ඇට ද දමා දෙහි අත්තක් ගෙන ඊට මන්තර කියා ජප කොට, ඇස්වහට ලක් වී සිටින පුද්ගලයාගේ හිස, මුහුණ හා ශරීරයට එම ජලය දෙහි අත්තෙන් ඉසියි. තිවස තුළ සහ තිවස අවට ද මෙම ජලය ඉස, ඉතිරි ජලය දෙහි අත්ත ද සමඟින් තිවසේ තබන අතර දෙහි අත්ත දුර්වර්ණ වී ජලයෙන් දුර්ගන්ධයක් පැතිරීම සිදුවුවහොත් ආතුරයා කෙරෙහි බොහෝ ඇස්වහ තිබූ බව විශ්වාස කෙරේ. ආතුරයා යනු යම් කිසි රෝගී තත්වයකට ලක් වුණු තැනැත්තාය. දෙහි කැපීමේ දී පළමුව බුදුගුණ කියා පසුව මන්ත්‍ර කියවීම සිදුකරන අතර ඇස්වහට ලක් වූ පුද්ගලයාගේ හිස, උරහිස, දෙ පතුල් පසුව යනා දී ස්ථාන මත දෙහි තබා කැපීම සිදු කෙරේ. මේ සඳහා සාමාන්‍ය වශයෙන් යොදා ගනු ලබන්නේ දෙහි ගෙඩි විසි එකකි. කපනු ලබන දෙහි ජලය පිරි බඳුනකට දමා පසුව ගලා යන දිය පහරකට දමනු ලැබේ. එමඟින් ඇස්වහ සමනය වේ යැයි විශ්වාස කෙරේ.

## වන සතුන්ගෙන් ආරක්ෂා වීම සඳහා

වන සතුන්ගෙන් ආරක්ෂා වීම සඳහා අතීතයේ දී සබරගමුව ප්‍රදේශයෙහි ජනතාව ගුප්තමය බලවේගයන්ගේ පිහිට ලබා ගෙන ඇත. වන සතුන්ගෙන් පීඩාවක් නොවී තමනට අවනත කර ගැනීම සඳහා ලේන්සුවට මන්ත්‍ර ජප කොට ඉණෙහි බැඳ ගෙන යාම, අත්ලට පිඹුම් කොට අත්පුඩි ගැසීම, පන්දම්වලට පිඹුම් කොට රැගෙන යාම වැනි අභිචාරමය අංග භාවිත වී ඇත.

## ඉනා බෙහෙත්වලින් ආරක්ෂා වීම

විශේෂයෙන් ම ඉනා බෙහෙත් දෙනු ලබන්නේ කිසියම් පුද්ගලයෙකුගේ සිත තමා කෙරෙහි නම්මවා ගැනීම සඳහා බව පෙනේ. යම් පුද්ගලයෙකුට ඉනාවක් කැවී තිබෙනවාද යන්න දැන ගැනීම සඳහා සබරගමු ප්‍රදේශයේ විවිධ ක්‍රම ඇති බව මෙම අධ්‍යයනය තුළින් දැනගත හැකි විය. දෙහි ගෙඩියක් ගෙන ඊට අදාළ මන්ත්‍ර ජිවම් කොට එම පුද්ගලයාගේ උදරයේ බැඳීමෙන් පසු දෙහි ගෙඩියේ ස්වරූපය අනුව ඉනාවක් කැවී ඇති බව හෝ නැති බව ද, ඉනාව දී කොපමණ කලක් ගත වෙනවාද යන්න දක්ෂ ඇදූරෙකුට කිව හැකි යයි විශ්වාස කෙරේ.

එසේම ඉනාවක් කැවී ඇත්නම් එය ඉවත් කිරීම සඳහා අභිචාරමය ක්‍රියාදාමයන් සිදු කරනු ලබයි. මෙය "ළය විරේකය" ලෙස ඇතැම්හු හඳුන්වති. ඒ සඳහා "විනරාජ" නැමැති මන්ත්‍රයෙන් ජප කොට අදාළ පුද්ගලයාට ඇඹුල් පස් වර්ගය බීමට දෙයි. ඒ සමහම අන්නාසි, කිරි, තැඹිලි යනාදිය දී දෙනු ලැබේ. මන්ත්‍ර බලය හේතු කර ගෙන දෙන ලද ඉනා බෙහෙත කොපමණ කාලයක් ගත වුව ද ගැල වී වමනය සමඟ ඉවත් වන බව විශ්වාස කෙරේ.

## ලෙඩ රෝගයන්ගෙන් ආරක්ෂා වීම සඳහා

බොහෝ ලාංකික ජනතාව ලෙඩ රෝගයන්ගෙන් ආරක්ෂාව පතා අභිචාර ක්‍රමයන්හි පිහිට පතන අවස්ථා සුලභ ය. සබරගමු ජනතාවට ද එය පොදු තත්වයකි. තුන් දොස් කිපී උන්මාද තත්වයට පත් වූ පුද්ගලයන් එම තත්වයෙන් මුදවා ගැනීම සඳහා "වෙසමුණි" හිරු මුද්‍රාව නම්; මන්ත්‍රයෙන් ලේන්සු

ගැටයකට එකසිය අට වරක් මතුරා ඉනෙහි බැඳීමෙන් ශාන්තිය උදා වන බව කියවේ.

ශාන්තිය බලාපොරොත්තුව පිරිත් කීම, පිරිත් නූල් ගැට ගැසීම, ඈත අතීතයේ සිට ම පැවත ආ ජනප්‍රිය අංගයකි. දුර්භික්ෂ, ඉඩෝර්ර, වසංගත ආදිය පැන නැගුණ අවස්ථාවන්හි දී භික්ෂූන් පිංකම් පැවැත් වූ බව ද විජය ප්‍රමුඛ පිරිස ලංකාවට ගොඩබට අවස්ථාවේදී ලංකා රක්ෂණ උපුල්වන් දෙවිඳු ඔවුන්ගේ ආරක්ෂාව පතා ඔවුන්ගේ අත්වල නූල් ඔතාලූ බව ද මධ්‍යකාලීන ලංකා සංස්කෘතිය නම් ග්‍රන්ථයෙහි සඳහන් වේ (ආරියපාල 1969:252). මේ සියල්ලෙන් ම පෙනී යන්නේ අනාදිමත් කාලයක් මුළුල්ලේ ලාංකීය ජනතාව "පිරිත් නූල" කෙරෙහි විශ්වාසයක් තබා ඇති බව ය. වත්මනෙහි සබරගමුව ප්‍රදේශයෙන්හි පමණක් නොව බොහෝ ජනතාව ගැබිණි මව්වරුන් සඳහා "අංගුලිමාල පිරිත" කියවනු ලබන බව ප්‍රත්‍යක්ෂ ය. මෙමඟින් ශාන්තිය උදා වී ප්‍රසූතිය පහසු වන බව විශ්වාස කෙරේ. ශරීරයෙහි හට ගන්නා ව්‍යාධි, එනම් ගෙඩි සමනය වීම සඳහා ද අභිචාර ක්‍රම භාවිත කෙරෙන අවස්ථා ඇත. ප්‍රථමයෙන් ම, "ඕං නමෝ අප සම්මා සම්බුද්ධ රජාණන් වහන්සේ වනළුලේ වැඩිය තැන දී........," යනුවෙන් බුදුන්ගේ නාමය සිහිපත් කරමින් තල තෙල් ස්වල්පයක් ගෙන ලුණු කැටයක් ද ඊට බහා මතුරා රෝගී තැනැත්තාගේ ව්‍යාධි සහිත ස්ථානවල කතා නොකොට ආලේප කිරීමෙන් සුවය ලැබෙන බව කියවේ. පසුව එම ලුණු කැටය තිවස තුළ තිබෙන කළයෙහි යටි පැත්තට (අඩියට) දමන අතර තෙත් බව හේතු කොට ගෙන ලුණු කැට ඉතා ඉක්මණින් දියව යන්නා සේ රෝගියාගේ ව්‍යාධිය ද සුව වන බවට විශ්වාසයක් පවතී.

උළුක්කුව සඳහා තල තෙල් මතුරා ආලේප කිරීම ද උදරයෙහි ආබාධ සඳහා ඉඟුරු මතුරා දීම ද වමනය නතර වීම සඳහා අබ මතුරා රෝගියාගේ

ගෙල වටේ ආලේප කිරීම ද හුණු මතුරා ආලේප කිරීම ද අතිසාරය සඳහා කෝපි සමඟ දෙහි මතුරා දීම ද ක්ලාන්තය සඳහා තැඹිලි මතුරා දීම ද කරන බව දැනගන්නට ලැබුණි.

වත්මනෙහි පවා වැඩිහිටි පුද්ගලයන් මෙම ක්‍රමයන්ට වඩාත් ප්‍රියතාවක් දක්වන බව ද පෙනෙන්නට තබේ.

## විනාශකාරී අභිචාර ක්‍රම

අභිචාර ක්‍රමයන්හි වඩාත් දරුණු ම අංශය මෙය ලෙස දැක්විය හැකි ය. නපුර සඳාලන මන්ත්‍ර ගුරුකම් ක්‍රමයට ව්‍යාවහාර වන නාමය "හූනියම" යනු යි. පුද්ගලයෙකු හෝ මුළු පවුලක් නැසීමට, එසේ නැතහොත් උග්‍රතර ශාරීරික හෝ මානසික පීඩා සැලසීමට හූනියම උපකාරී වේ යැයි ලංකාවේ වෙනත් ප්‍රදේශවල මෙන් ම සබරගමුවේ බොහෝ ජන කොටස් ද විශ්වාස කරති.

පුද්ගලයෙකු තවත් පුද්ගලයෙකුට හූනියමක් කරන්නේ ඇයිද යන්න විමසා බැලිය යුතු තවත් ප්‍රශ්නයකි. කෙනෙකුගේ දියුණුවට ඊර්ෂ්‍යා කිරීම සිංහල සමාජයේ බහුල ලෙස දක්නට ලැබේ. එයින් ඇතිවන ප්‍රකෝපය හා පළි ගැනීම සඳහා හූනියම් කිරීමෙන් දියුණු වන පුද්ගලයින් පහත හෙළීම දූෂ්‍ය සමාජයේ සිරිතකි (විජේසේකර 1960 : 201). එම්. බී. ආරියපාල මහතා මධ්‍යකාලීන ලංකා සමාජයේ කෘතියෙහි දක්වන පරිදි වැටුණු දත්, හිසකෙස් යනාදි ය නොපෙනෙන සේ සඟවා තබන්නේත් අනුන් දෙන ආහාර පාන පිළිගන්නට බොහෝ දෙනෙක් අකමැති වන්නේත් හූනියම් ආදියට සිංහල ජනතාව තුළ පවතින බිය මුසු හැඟීම් නිසා ය (ආරියපාල 1962:182).

විනාශකාරී අභිචාර ක්‍රම ලාංකීය ජන කොටස්වලට පමණක් ම සීමා වේ යයි සිතිය නොහැකිය. වෙනත් සමාජවල ද මෙවැනි අංග ඇත. මෙවැනි දෑ මඟින් විද්‍යමාන වන්නේ පුහුදුන් මනුෂ්‍ය ස්වභාවය යයි එක් අතකින් සිතිය හැකිය.

## දරු ප්‍රසූතිය වැළැක්වීම සඳහා

දරු ප්‍රසූතිය වලක්වා මවත්, දරුවාත් යන දෙදෙනා ම මරණයට පත් කළ හැකි අන්දමේ අභිචාර ක්‍රම තිබේ යයි විශ්වාස කෙරේ. අදාළ තැනැත්තිය ගේ පයට පෑගුණු වැලි ගෙන, එය ගොළුබෙලි කටුවක බහා නියමිත මන්ත්‍ර ජප කොට හූඹස් කටක හිර කිරීමෙන් එම ගැබිණි කාන්තාවට දරුවා බිහි නොවන බවත් වේදනාවන් විඳ මරණයට පත් විය හැකි බවත් ඇතැම්හු විශ්වාස කරති. සමීප ව පිහිටි පොල් ගස් දෙකක කොළ දෙකක් ගෙන එකට ගැට ගැසීමෙන් කරනු ලබන අභිචාර ක්‍රමයක් ද ඇති බව දැනගන්නට ලැබුණ අතර මෙය ද ප්‍රසූතිය අපහසු කරවන අන්දමේ අභිචාරාංගයක් බව පෙනේ. එසේ ම රෝගී තත්වයන් ඇති කිරීම සඳහා ද ගොළුබෙලි කටුවකට වැලි මතුරා හූඹස් කටක හිරකිරීමේ ක්‍රමය ම පවතී.

## ස්ත්‍රී-පුරුෂ දෙදෙනා වෙන් කිරීම සඳහා

තඹ පත්තිරු දෙකක වෙන් කිරීමට අවශ්‍ය ස්ත්‍රී පුරුෂ දෙදෙනාගේ රූප ඉස, දෙපතුල, මාරු වන සේ ඇඳ, පස් පැහිරි කටු පහක් ගෙන ඊට මතුරා, රූප අඳින ලද තඹ පත්තිරු දෙක එකට අලවා ඒ මත ස්ථාන පහක කටු ගසනු ලැබේ. හිස, දෙපතුල්, උරහිස්, පපුව යන දී ස්ථානවල එම මතුරන ලද කටු ගැසීමෙන් දෙදෙනා භේද වන බව කිය වේ. තව ද තැඹිලි ගෙඩියක් ගෙන ඒ මත අවශ්‍ය දෙදෙනාගේ හැඩ රුව ඇඳ ජීවම් කොට සොහොන් පලක වල දැමීමෙන් පවුල්

අසමගිය ඇති කළ හැකි බව කියනු ලැබේ. සිනි මතුරා දීමෙන් ද අඹු සැමියන් යුවලක් හෝ ආදරවන්තයින් දෙදෙනෙකු වෙන් කළ හැකි යයි විශ්වාස කෙරේ. දෙදෙනෙක් වෙන් කිරීම සඳහා කරනු ලබන තවත් අභිචාර විශේෂයක් ලෙස දැක්විය හැක්කේ "පැන්නුම්" ය. අවශ්‍ය පුද්ගල නම් තම පතක ලියා අදාළ ගුප්ත ශාස්ත්‍ර ක්‍රම අනුගමනය කොට අවශ්‍ය අය ගමන් කරන ස්ථානයක් බලා වල දැමිය යුතු බව කිය වේ.

එසේ පැන්නුමක් සිදු වූ පසු දෙදෙනා අසමගි වන බව කියැ වේ. "වැල් පැන්නුම්", "ඉරි පැන්නුම්", "දෙහි පැන්නුම්" යනා දී ලෙස විවිධ පැන්නුම් වර්ග තිබෙන බවක් පෙනේ. දෙහි පැන්නීමේ දී එය තුන් වරුවක් යාමට පෙර අදාළ පුද්ගලයාට පැන්නවිය යුතු බවත්, ඊාවහන් පැලඳ සිටිය දී පැන්නීම සිදුවුවහොත් එහි ප්‍රතිඵල හින වන බවත් ගුප්ත ශාස්ත්‍රඥයන්ගේ මතයයි. එසේ ම පවුල් අසමගිකම් ඇති කිරීම සඳහා ගල්කැට මතුරා ලිපට දැමීමේ අභිචාරමය අංගයක් ඇති බව ද අළු මතුරා කඩු ගුල් සහ දිම් ගොටුවලට දැමීමක් ද ඇති බව සොයා ගත හැකි විය. එසේ අළු දැමීමෙන් දිමියන්, කඩියන් අපහසුතාවට පත් වී සී සී කඩ ඵලා යන්නා සේ පවුල් ද විනාශ වී විසිරී යන බව විශ්වාස කෙරේ.

## රෝගී තත්වයන් ඇති කිරීම සඳහා

අභිචාර ක්‍රම මගින් පුද්ගලයන්ට රෝගී තත්වයන් උදා කළ හැකි බවට විශ්වාසයක් ද ජනතාව අතර පවතී. විශේෂයෙන් ම නිවසේ ගෘහ මූලිකයා අසනීප වී සිටින අවස්ථාවක දී මරණයට පත් කළ හැකි අන්දමේ අභිචාර ක්‍රම ද පවතින බව විශ්වාස කෙරේ. මුට්ටියක පිළිවකුගේ රූපය රත් හඳුනෙන් ඇඳ සතුරාගේ නම එම රූපයේ මධ්‍යයේ ලියා සොහොන් පලේ මුතින් අතට නැමීමේ

අභිචාරමය අංගයක් ද සබරගමුව ප්‍රදේශයේ පැවත ඇත. මෙලෙස මුළු ජීවිත කාලයම රෝගියෙකු ලෙස ගත කිරීමට සිදු වූ පුද්ගලයෙකු හා සම්බන්ධ තොරතුරු රත්නපුර මුද්දුව ප්‍රදේශයෙන් සොයා ගත හැකි විය.

අභිචාර වනාහි ඉතාමත් සංකීර්ණ විෂය ක්ෂේත්‍රයක් බවත්, අනාදිමත් කාලයක් තිස්සේ විවිධ ජන සමාජයන් හි ක්‍රියාත්මක වූ බවටත්, වත්මනෙහි පවා ක්‍රියාත්මක වන බවත් පිළිගත හැකි කරුණකි. මැලිනොව්ස්කි, රේමන්ඩ් ෆර්ත් වැනි මානව විද්‍යාඥයන් පවා මේ පිළිබඳව පර්යේෂණ පවත්වා කරුණු එක් රැස් කිරීමෙන් පැහැදිලි වන්නේ එය විවිධ සංස්කෘතීන්හි විවිධාකාරයෙන් ක්‍රියාත්මක වන බවකි. ලාංකිය සමාජ ව්‍යුහය දෙස බලන විට ද විවිධාකාර අභිචාරාංගයන් ක්‍රියාත්මක වන බව කිව යුතුය. එක් අතකින් බලන විට කෙලෙස් මලින් පිරුණු අභිවෘද්ධිකාමී මිනිසාගේ සිත්හසර හෙළි කරනු ලබන කැටපතක් ලෙස ද අභිචාර හැඳින්විය හැකි අතර සංකීර්ණ මානසික චිත්තය ද නිරූපණය වේ යයි ද සිතිය හැකි ය. වත්මන් තාක්ෂණික දියුණුව හමුවේ සංස්කෘතිකාංග ශීඝ්‍රයෙන් ගිලිහී යන ප්‍රවණතාවක් දක්නට ලැබුණ ද යම් මට්ටමකින් හෝ මෙම ක්‍රියාදාමය සිදුවන බව ද කිව යුතු ය. උදාහරණයක් ලෙස සබරගමුව ප්‍රදේශයට අධිපති දෙවියන් සේ සැලකෙන සුමණ සමන් දෙවියන් විෂයෙහි මෙම ප්‍රදේශයෙහි ජනතාව තුළ පවතින්නා වූ භක්තිය හා පවත්වනු ලබන අභිචාරාංග දැක්විය හැකි ය. එසේ ම සබරගමු ප්‍රදේශයට පමණක් ම සුවිශේෂ වූ කිරිමඩුව නම් ශාන්ති කර්මය වැනි ද යහපත් සේ සැලකිය හැකි අතර විනාශකාරී අභිචාර ක්‍රම පුද්ගල විනාශය ඇති කරන බැවින් අනුමත කළ නොහැකි බව ද කිව යුතු ය.

ජනශ්‍රැති අධ්‍යයනයේ දී මෙම අභිචාර විශේෂ වැදගත් ස්ථානයක් ද හිමි කොට ගන්නා බව කිව යුතු අතර ම සංස්කෘතික අනන්‍යතාව හෙළි කරනු ලබන සංකේතයක් වශයෙන් ද සැලකිය හැකිය.

සබරගමුව ප්‍රදේශයෙහි අභිචාර විධි සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේ දී දක්නට තිබූ ලක්ෂණයක් ලෙස ග්‍රාමීය ව සමහර ජන කොටස් පමණක් මෙම අභිචාර විශ්වාස කිරීම දැක්විය හැකි ය. එසේම තරුණ පරපුර අවඥාසහගත දෘෂ්ටියක් හෙළන බැවින් මෙම අභිචාර විධි වඳ වීමේ ප්‍රවණතාවක් තිබෙන බව ද කීම වඩාත් සාධාරණය. එසේ වුව ද පිරිත් නූල් ගැට ගැසීම බෝධි පූජා පැවැත්වීම ශාන්ති කිරීම යනාදිය පුද්ගල ආධ්‍යාත්මය සුවපත් කරවනු ලබන යහපත් අභිචාරාංග ලෙස ලාංකික ජන සමාජය තුළ ඉමහත් ජනප්‍රියත්වයක් ද ලබා තිබෙන බව කීම වඩාත් යුක්ති යුක්ත ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය


01. ආරියපාල එම්. බී. මධ්‍යකාලීන ලංකා සමාජය , ලංකාණ්ඩුවේ මුද්‍රණාලය 1962.

02. කෝට්ටගොඩ ජයසේන – සබරගමු කිරිමඩු ශාන්ති කර්මය, දළුවත්ත ප්‍රින්ටර්ස්, කොළඹ, 1995.

03. George Frazer, James- The Golden Bough, London, 1950

04. Giddns Anthony – Sociology ($2^{nd}$ ed:) Blackwell Publishers, Oxford - 1993

05. ගයිගර් විල්හෙල්ම් - (ආචාර්ය ඇම්. බී. ආරියපාල, පරිවර්තනය) මධ්‍යකාලීන ලංකා සංස්කෘතිය, ගුණසේන සහ සමාගම, කොළඹ 1969.

06. Firth Raymond – Human Types, The American Library, 1956.

07. Malinowoski Bronislaw – Argonauts of the Western Pacific, London, 1922

08. රත්නපාල ඊ. ඇම්. – ජන ජීවිතය, ජන ශ්‍රැතිය හා රයිගම, ඇස් ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 1991.

09. විජේසේකර නන්දදේව, ලංකා ජනතාව, ගුණසේන සහ සමාගම, කොළඹ, 1960.

10. Sills D.L.(ed) – International Encyclopedia of the Social Sciences, Crowell Collier and Macmillan, USA, 1968

11. සුසිල හිමි කෝම්පිටියේ – ඓතිහාසික රත්නපුර (සංස්: බන්දුල ලියනගේ) සබරගමුව පලාත් සභාව, රත්නපුර 1992.

# පාරිභාෂික ශබ්ද මාලාව

ජනශ්‍රැති - Folklore
අභිචාර - Magic
සුදු අභිචාර - White Magic
කළු අභිචාර - Black Magic
සමානාත්මතා න්‍යාය - Law of Similarity
ස්පර්ශනාත්මක න්‍යාය - Law of Contact
ඵලදායක - Productive
ආරක්ෂාදායක - Protective
විනාශදායක - Destructive
ඵලදායක අභිචාර විධි - Productive Magic
ආරක්ෂක අභිචාර විධි - Protective Magic
විනාශකාරි අභිචාර විධි - Destructive Magic